# රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

## භාෂා ප්‍රවීණතා විභාගය

**විශේෂ සටහන -**

**විභාග අපේක්ෂකයන්ගේ පහසුව හා මඟ පෙන්වීම පිණිස භාෂා ප්‍රවීණතා කථන හැකියා පරීක්ෂණය සඳහා වන ආදර්ශ සංවාද මාතෘකා කිහිපයක් පහත දක්වා ඇත.**

<u>**I වන මට්ටම**</u>

1. ඔබ ආයතන ප්‍රධානියෙකු යැයි සිතන්න. ඔබට මාස 03ක කාලයක් සඳහා විදේශගතවීමට සිදුවී ඇත. එම කාලය තුළ ඔබගේ වැඩ ආවරණය කරන නිලධාරියාට සිදුකළ යුතු රාජකාරී පිළිබඳ විස්තර කරමින් සිදුකරන සංවාදයක්

   i. අපේක්ෂකයා - ආයතන ප්‍රධානි
   ii. උපදේශක - වැඩ ආවරණය කරන නිලධාරි

2. ඔබ ආයතන ප්‍රධානියෙකු යැයි සිතන්න.ඔබ ආයතනයෙන් ජනතාවට සිදුවන සේවය පිළිබඳව මාධ්‍ය වේදියෙකුට විස්තර ඉදිරිපත් කරමින් සිදුකරන සංවාදයක්

   i. අපේක්ෂකයා - ආයතන ප්‍රධානි
   ii. උපදේශක - මාධ්‍ය වේදියා

3. ඔබ ආයතන ප්‍රධානියෙකු යැයි සිතන්න.ඔබගේ කාර්යාලයේ සේවකයෙකු විශාල වශයෙන් නිවාඩු ලබාගන්නා බව ඔබට නිරික්ෂණය වී ඇත. අත්‍යාවශ්‍ය අවස්ථාවන්හිදී හැර නිවාඩු ලබානොගත යුතු බව දන්වමින් එම සේවකයාට උපදෙස් දෙමින් සිදුකරන සංවාදයක්

i. අපේක්ෂකයා - ආයතන ප්‍රධානි

ii. උපදේශක - නිවාඩු ලබාගන්නා නිලධාරි

4. ඔබ ආයතන ප්‍රධානියෙකු යැයි සිතන්න.ඔබගේ කාර්යාලයේ නිලධාරියෙකු උසස්වීමක් ලබා කාර්යාලයෙන් ස්ථාන මාරුවී යාමට නියමිතය. එම නිලධාරියාට සුභ පතමින් සිදුකරන සංවාදයක්

i. අපේක්ෂකයා - ආයතන ප්‍රධානි

ii. උපදේශක - ස්ථාන මාරුවී යන නිලධාරි

5. ඔබ ආයතන ප්‍රධානියෙකු යැයි සිතන්න. රාජකාරී කටයුත්තකට ක්ෂේත්‍රයට ගමන් කරද්දි ඔබගේ නිල වාහනය අනතුරකට ලක්වී ඇත.ඒ සම්බන්ධ තොරතුරු පවසමින් වාහනය රක්ෂණය කරන ලද ආයතනයේ නිලධාරියෙකු සමඟ සිදුකරන සංවාදයක්

i. අපේක්ෂකයා - ආයතන ප්‍රධානි

ii. උපදේශක - රක්ෂණය ආයතනයේ නිලධාරි

6. ඔබ ආයතන ප්‍රධානියෙකු යැයි සිතන්න.ඔබගේ ආයතනයේ නිලධාරීන් දෙමළ භාෂාව ඉගැන්වීමට තෝරාගත් ගුරුවරයෙකු සමඟ විස්තර විමසමින් සිදුකරන සංවාදයක්

i. අපේක්ෂකයා - ආයතන ප්‍රධානි

ii. උපදේශක - ගුරුවරයා

7. ඔබ ආයතන ප්‍රධානියකුයැයි සිතන්න. ඔබගේ ආයතනයට නවක නිලධාරීයකු පත්වීම් ලබාගෙන පැමිණ ඇත. එම නිලධාරියාගෙන් තොරතුරු විමසමින් රාජකාරි ඉටුකරන ආකාරය පිළිබඳ උපදෙස් දෙමින් සිදුකරන සංවාදයක්.

   i. අපේක්ෂකයා - ආයතන ප්‍රධානි
   ii. උපදේශක - නවක නිලධාරි

8. ඔබ ආයතන ප්‍රධානියකුයැයි සිතන්න. ඔබගේ කාර්යාලය පිහිටි පරිශ්‍රයේ ඩෙංගු රෝගය පැතිරයාමේ අවධානමක් ඇත. මේ සම්බන්ධව ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධව ආයතනනයේ පරිපාලන නිලධාරි දැනුවත් කරමින් සිදුකරන සංවාදයක්.

   i. අපේක්ෂකයා - ආයතන ප්‍රධානි
   ii. උපදේශක - පරිපාලන නිලධාරි

9. ඔබ ආයතන ප්‍රධානියකුයැයි සිතන්න. විදේශ ශිෂ්‍යත්ව වැඩසටහන් සඳහා සුදුසු නිලධාරීන් නම් කර එවන ලෙස දන්වා ඇත. ඒ අනුව සුදුසු නිලධාරීන් තෝරාගැනීම සම්බන්ධව පරිපාලන නිලධාරි සමඟ සිදුකරන සංවාදයක්.

   i. අපේක්ෂකයා - ආයතන ප්‍රධානි
   ii. උපදේශක - පරිපාලන නිලධාරි

10. ඔබ ආයතන ප්‍රධානියකුයැයි සිතන්න. ආයතනයට අදාළ ඊළඟ වර්ෂයේ සැලැස්ම සැකසීම සම්බන්ධව සැලසුම් අංශය භාර නිලධාරි සමඟ සිදුකරන සංවාදයක්.

   i. අපේක්ෂකයා - ආයතන ප්‍රධානි
   ii. උපදේශක - සැලසුම් අංශය භාර නිලධාරි